# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2256/55 – 2021 දෙසැම්බර් මස 03 වැනි සිකුරාදා – 2021.12.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය:IR/COM/03/2019/03 (i).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන**
**කාර්මික ආරාවුල් පනතේ**
4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

**එක් පාර්ශවයක් වශයෙන්**

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා
 322/1,
 ගාලු පාර,
 රත්මලාන.

2. ඒ. ඩී. සී. බුද්ධදාස මයා
 "ශ්‍යාමලී",
 දියගම,
 ගල්පාත.

**සහ**

**අනෙක් පාර්ශවය වශයෙන්**

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල

131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

*බණ්ඩාරවෙල,*
*වැලිමඩ පාර,*
*අංක 25 ඒ, ගස්වත්ත,*
**නීතිඥ එම්. ඒ. ජී. හෙරේෂා ක්‍රිස්ටීන් මහත්මිය** පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය:IR/COM/03/2019/03 (i).

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

**එක් පාර්ශවයක් වශයෙන්**

1. එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා
322/1,
ගාලු පාර,
රත්මලාන.

2. ඒ. ඩී. සී. බුද්ධදාස මයා
"ශ්‍යාමලී",
දියගම,
ගල්පාත.

**සහ**

**අනෙක් පාර්ශවය වශයෙන්**

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට**
**හේතුවී පවත්නා කරුණු වනුයේ**

"ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කර ඇති එන්. එල්. ඩී. පී. එච්. සාන්තරාජා මයා, ඒ. ඩී. සී. බුද්ධදාස මයා යන සේවකයින්ට උසස්වීම් ලබා දීමේ දී අසාධාරණයක් සිදුව තිබේද? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම්, එම එක් එක් සේවකයාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

2021 නොවැම්බර් මස 23 වැනි දින,

කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

EOG 12 - 0033

මගේ අංකය:IR/COM/02/2019/218.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය
(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ
4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

**එක් පාර්ශවයක් වශයෙන්:**

එන්. ජී. ඒ. විජේනායක මයා,
අංක 4 බී, 57 එල්,
ජාතික නිවාස යෝජනා ක්‍රමය,
රද්දොළුගම.

**සහ**

**අනෙක් පාර්ශවය වශයෙන්:**

ලර්නියම් ජාත්‍යන්තර පාසල, අංක 02,
ඩඩ්ලි සේනානායක මාවත,
කොළඹ 08.

**වර්තමාන නම සහ ලිපිනය: -**
ලිබර්ටි ඉන්ටර්නැෂනල් කොලේජ්,
65/3, බුත්ගමුව පාර,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

***පිටකෝට්ටේ,***
***රජමහ විහාර පාර,***
***නො. 48 ඒ,***
***නීතිඥ පී. ඩී. එම්. සංජය ගමගේ මයා*** පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 23 වැනි දින,

කොළඹ දී ය.

මගේ අංකය:IR/COM/02/2019/218.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

**එක් පාර්ශවයක් වශයෙන්:**

එන්. ජී. ඒ. විජේනායක මයා,
අංක 4 බී, 57 එල්,
ජාතික නිවාස යෝජනා ක්‍රමය,
රද්දොළුගම.

**සහ**
**අනෙක් පාර්ශවය වශයෙන්:**

ලර්නියම් ජාත්‍යන්තර පාසල, අංක 02,
ඩඩ්ලි සේනානායක මාවත,
කොළඹ 08.

**වර්තමාන නම සහ ලිපිනය -**
ලිබර්ටි ඉන්ටර්නැෂනල් කොලේජ්,
අංක 65/3, බුත්ගමුව පාර,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

**ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට**
**හේතුවී පවත්නා කරුණු වනුයේ**

"ලර්නියම් ජාත්‍යන්තර පාසලේ (වර්තමාන ලිබර්ටි ඉන්ටර්නැෂනල් කොලේජ්) සේවය කළ එන්. ජී. ඒ. විජේනායක මහතාගේ සේවය නතර කිරීම හා එදින සිට කොන්ත්‍රාත් කාලය අවසන් වන තෙක් අදාළ වැටුප් නොගෙවීම අයුක්තිසහගත හා අසාධාරණ වන්නේ ද යන්නත්, එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද? යන්නත් පිළිබඳව වේ."

2021 නොවැම්බර් මස 23 වැනි දින,

කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

EOG 12 - 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.